# සිංහල - 9 ශ්‍රේණිය

## දැසේ නිල් පැහැය

කාව්‍ය නිර්මාණ කියවා රස විඳීමෙන් පුද්ගල මනස සන්සුන් වේ.නිර්මාණයක රසය විඳ ගැනීමේ සහජ කුසලතාව හෙවත් වාසනා ගුණය පුද්ගලයා සතුව පැවතිය යුත්තකි.කවිය තුළින් ජීවිත අවබෝධය ඇති කරයි. උපේක්ෂා සහගත දෘෂ්ටිය ඇති කරයි. ඉවසීම ප්‍රගුණ කරවයි. මිනිස් සිත හඳුනා ගැනීමට ඉඩහසර පාදා දෙයි.

- **ඉහත පාඩම කියවා පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

1. දැසේ නිල් පැහැය පාඩම උපුටා ගැනුණේ කවර ග්‍රන්ථයකින් ද ?
2. එම ග්‍රන්ථයෙහි කතුවරයා කවුද ?
3. එම කතුවරයා ලියූ, පද්‍ය කෘති තුනක්, කෙටිකතා කෘති දෙකක් , පරිවර්තන නවකතා දෙකක් සහ පරිවර්තන නවකතාවක්ලියා දක්වන්න.
4. දැසේ නිල් පැහැය තුරන් වීමට බලපෑ හේතු තුනක් ලියන්න
5. තරුණ අවධියේ මෙහි සඳහන් බිරිඳගේ දෑස් සැමියා විසින් ඇගයීමට ලක් කළ අයුරු දැක්වෙන කවි පද පේළි උපුටා දක්වන්න.

**පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

1. විශේෂණ පද යනුවෙන් අදහස් වන්නේ මොනවාදැයි ලියා දක්වන්න.

2. විශේෂණ පද බෙදෙන කොටස් දෙක නම් කර ඒ සඳහා නිදසුන් පහ බැගින් ලියන්න.

3. පහත යෙදුම්වල ඇතුළත් නාම විශේෂණ පද උපුටා දක්වන්න.

මඳ සැනසිල්ල -
දෙව් බොජුන් -
සිනා හඬ -
යොවුන් විය -
ඈත දියඹ -
නිදි පැදුර -
කෙඳිරිලි හඬ -
නිල් දෑස -

4.පහත වාක්‍යවල ඇතුළත් ක්‍රියා විශේෂණ පද උපුටා දක්වන්න.

ඇය සෙමින් කතා කරයි.

දරුවා බියෙන් හඬයි.

ඔහු ප්‍රවේශමෙන් රිය පදවයි.

ළමයා සතුටින් සෙල්ලම් කරයි.

ඇය හොඳින් ඉගෙන ගනියි.

ගංවතුර ඉක්මනින් පහ විය.

ගුරුවරු දයාවෙන් අමතති.

ඔවුහු වේගයෙන් දිවූහ.

4. ඔබ කැමති නාම විශේෂණ පද දහයක් යොදා වාක්‍ය දහයක් ලියා දක්වන්න.

5. ඔබ කැමති ක්‍රියා විශේෂණ පද දහයක් යොදා වාක්‍ය දහයක් ලියා දක්වන්න .

6. පහත දැක්වෙන වාක්‍යවලට සුදුසු නාම විශේෂණ පද වරහන් තුළින් තෝරා ලියන්න.

(විනීත , තරුණ , කපටි , චතුර , රන්, සුන්දර , අලස , මලානික , විශිෂ්ට , මිහිරි)

1.....................පරිසරයක අපි ජීවත් වෙමු.

2.....................වෙළෙන්දා අසරණයන් රවටයි.

3.වැස්ස නිසා.................ගස්වැල් ප්‍රාණවත් විය.

4..................ළමයි පාසල් වැඩ අතපසු කළහ.

5.ජනකවි අතර ......................නිර්මාණ බොහෝ තිබේ.

6.ශ්‍රාවකයෝ ....................කථිකයාගේ දේශනය අවධානයෙන් ඇසූහ.

7.අම්මා අක්කාට.................මාලයක් ගෙනාවාය.

8.ගමේ....................පිරිස ශ්‍රමදානයකින් පාර සාදයි.

9.....................වදන්වලට කවුරුත් ප්‍රිය කරති.

10...................ළමයි පාසලේ නීති රීති රකිති.

7.පහත සඳහන් ක්‍රියා විශේෂණ පද සුදුසු ලෙස යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(ආශාවෙන් , අකමැත්තෙන් , වහ වහා , විමසිල්ලෙන් , සුදට සුදේ , ලස්සනට , අලසව , පුදුමයෙන්)

1. නංගී අකුරු......................ලියයි.
2. වෙසක් සඳ ......................බබළයි.
3. මම කසාය......................බීවෙමි.
4. වැසි වසිද්දී ළමයි පන්ති කාමරවලට ...................දිව්වෝය.
5. ගවයා .......................වැතිර සිටියි.
6. විදේශිකයෝ වැදි නැටුම්.................... නැරඹූහ.
7. බළලා කිරි ........................බොයි.
8. පොලිස් නිලධාරියා නිවසේ සෑම තැනක් ම .....................බැලුවේ ය.

7.කවියෙකුට අත්දැකීම් ලබා ගත හැකි ක්‍රම තුනක් නම් කරන්න.

8.රූපකාර්ථ යනුවෙන් හැඳින්වෙනුයේ මොනවාද?

9.කවිය පිළිබඳ ඉදිරිපත් ව ඇති නිර්වචන තුනක් ලියා දක්වන්න.

10.පහත මාතෘකා යටතේ කවි පහ බැගින් නිර්මාණය කරන්න.

නිල් අහස

රණ දෙරණ

උදෑසනක අසිරිය

වැහිබර දිනක්

අසිරිමත් රැයක්

ජී.එල්. වත්සලා

ර/ නිවි/සුමන ම.ම.වි.